# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2386/09 - 2024 මැයි මස 29 වැනි බදාදා - 2024.05.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත

2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ 3 වන වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින් මෙම නියෝගය මඟින් 2024 පෙබරවාරි 02 දිනැති අංක 2369/42 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මඟින් අවසන් වරට සංශෝධනය කරන ලද පරිදි 2022 අංක 1 දරන කැසිනෝ ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබාදීමේ නියෝග, එහි දෙවැනි උපලේඛනයෙහි (3) අයිතමයට වහාම ඉක්බිතිව අයිතම (4) ලෙස මෙහි පහත සඳහන් අයිතමය එකතු කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ;

“

| | *නිර්ණායකය* | *කැසිනෝ බලපත්‍ර ගාස්තුව* | *කැසිනෝ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තුව* |
|---|---|---|---|
| 4 | 2022 අගෝස්තු 31 දිනැති අංක 2295/10 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයේ ප්‍රකාශයට පත්කර ඇති 2022 අංක 1 දරන කැසිනෝ ව්‍යාපාර බලපත්‍ර රෙගුලාසියේ නියම කර ඇති ඇගයීම් ක්‍රියාවලිය සම්පූර්ණ කර 2023 ජනවාරි 01 සිට ආරම්භ වන සහ 2024 ජනවාරි 12 දිනට පෙර අවසන් වන කාල පරිච්ඡේදය තුළ එම නියෝගයෙහි නිශ්චය කර ඇති අදාළ බලපත්‍ර ගාස්තුව ගෙවා ඇති අයදුම්කරුවන් | රුපියල් මිලියන පන්සියයක් - වසර පහක් සඳහා පමණි | රුපියල් බිලියන දහයක් |

”

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 මැයි මස 29 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 06 - 0048

1A - PG 6748 — 404 (2024/06 ) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*